1 9 SEP 2019

මාගේ අංකය 030/3/7
නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය,
රිදිබැදිඇළ ව්‍යාපාරය,
නිකවැරටිය.
2017.08.21

රිදීබැඳි ඇළ ව්‍යාපාරයේ
ව්‍යාපාර කමිටුවේ සියළු කමිටු සාමාජිකයින් වෙත

ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම - රිදීබැඳිඇළ මහා වාරි ව්‍යාපාරය

ව්‍යාපාර කළමණාකරණ කමිටුව - 2017 අගෝස්තු
දිනය හා වේලාව - 2017.08.10 පෙ.ව.9.30
ස්ථානය - ව්‍යාපාර කළමණාකරන කාර්යාලය
සහභාගිත්වය - 37

චාරිත්‍රානුකූලව ආගම සිහිකිරීමෙන් අනතුරුව ව්‍යාපාර කමිටු රැස්වීමට පැමිණි සියලු රාජ්‍ය නිලධාරීන් හා ගොවිසංවිධාන නිලධාරීන් නේවාසික ව්‍යාපාර කළමණාකාරතුමා විසින් පිළිගන්නා ලදි.

**අරමුණු පැහැදිලි කිරීම**

2017 අගෝස්තු මාසයට අදාල ව්‍යාපාර කළමණාකරණ කමිටු රැස්වීමේ කටයුතු සාකච්ජා කිරීමත් වන අලි ගැටළුව පිළිබඳ සාකච්ජා කිරීමට නියමිත බවත් පැහැදිලි කරන ලදී.

**ලිපි ඉදිරිපත් කිරීම**

දිවුල්ලැව සිට කඩිගාව දක්වා ඉදිකළ ඇළ මාර්ගය මහා වාරිමාර්ග පද්ධතියට පවරා ගැනිම සඳහා නම්මුවාව නුස්රත් ගොවිසංවිධානය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය.

**නේවාසික ව්‍යාපෘති කළමණාකරු**

නම්මුවාව ප්‍රදේශයේ ගොවීන්ගේ ඉල්ලීම් ඉටුකිරීමට වාරිමාර්ග ඉංජිනේරුතුමාට හා තමාට හැකියාවක් නොමැති බවත් දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවට හා අමාත්‍යාංශ මට්ටමින් ඉදිරිපත් කර විසඳුම් ලැබාගත යුතු බවද පැහැදිලි කරන ලදී.මේ වන විටද අදාල අංශ දැනුවත් කර ඇති බවද පෙන්වා දෙන ලදී.

**ආයතන සංවර්ධන ප්‍රගතිය.**

ගොවි සංවිධාන මට්ටමින් කමිටු රැස්වීම් පැවැත්වීම හා මුදල් සාරාංශ ලැබීමේ ප්‍රගතිය.

| ගොවිසංවිධානය | මාසික කමිටු රැස්වීම් පැවැත්වීම. | මාසික මුදල් සාරාංශ ලැබීම | නිලවරණ (පැමිණීම) | වෙනත් වැඩසටහන් |
|---|---|---|---|---|
| බලගොල්ලාගම | ✓ | ✓ | ✓ | බලගොල්ලාගම 2016 වසරට විගණනය සිදුකිරීම. |
| බුදුමුත්තාව | ✓ | ✓ | ✓ | |
| කැබැල්ලෑව | ✓ | ✓ | | |
| හීලෝගම | ✓ | ✓ | | |
| දිවුල්ලෑව | ✓ | ✓ | ✓ | |
| දණ්ඩුවාව | ✓ | ✓ | | |
| තරණගොල්ල | ✓ | ✓ | | |
| මැදඇල | ✓ | ✓ | | |
| ඉබ්බාවල | ✓ | ✓ | | |
| මාගල්ලේගම | ✓ | ✓ | | |
| කටගමුව | ✓ | ✓ | | |
| මාහුල් මහසෙන් | ✓ | ✓ | | |
| ඕතොට දිවුල්ලෑව | ✓ | ✓ | | |
| කිරිඳිගල්ල | ✓ | ✓ | | යහපත් කෘෂිකාර්මික පිළිවෙත් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන |
| ව්‍යා: ගො: සං: | ✓ | ✓ | | |

**ගරු සභාපති - කැබැල්ලෑව ගොවි සංවිධානය**

වන අලින්ගෙන් කුඹුරු ආරක්ෂා කිරිමට විශාල වියදමක් දැරිමට සිදුවන බව දැන්විය. එසේම වනජීවි කාර්යාලයේ නිලධාරීන් ප්‍රමාණවත් තරම් නොමැති නිසා වන අලි එලවා හැරීමට එම නිලධාරින්ගේ සහයෝගය බලාපොරෙත්තු විය නොහැකි අතර ලැබෙන අලිවෙඩි ප්‍රමාණවත් නොවන බවද ප්‍රකාශ කරන ලදි.

**ගරු සභාපති - බුදුමුත්තාව ගොවි සංවිධානය**

උඩහේනේගම පාර වනඅලි මාරුවන ස්ථානය රැකිම අපහසු කාර්යක් බවත් මිටර් 200 පමණ පාර දෙපස කැලය නිසා අලි ළගට එනතුරු නොපෙනෙන නිසා දේශපාලන අධිකාරියේ සහය ඇතිව පාර දෙපස මීටර් 5 පමණ එහාට ශුද්ධ කළයුතු බව පැවසිය.

**ගරු සභාපති - හිලෝගම ගොවි සංවිධානය**

හිලෝගම ගොවි සංවිධාන බල ප්‍රදේශයට අයත් මහ ඇල හරහා කුඹුරු වලට පැමිණෙන වන අලින්ගෙන් හානි සිදුවිමට ඉඩනොදි ගොවීන් විසින් කුඹුරු රැකගන්නා බව හා වනජිවි කාර්යාලයේ නිලධාරීන්ගේ සහයෝගය ලබා දෙන්නේනම් වන අලි මාරුවන ස්ථානවල සංචාරය කිරිම කළහැකි බව පැවසිය.

**ස්ථාන භාර නිලධාරි වනජිවි කාර්යාලය - නිකවැරටිය**

ගොවින් අපහසුතාවයට පත් නොවන ආකාරයට අලිවෙඩි බෙදාහැරීමට කටයුතු සිදුකරන බවත් රිදිබැඳිඇල ව්‍යාපාරය තුළ පමණක් නොව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 21 ක වනඅලි සැරිසරන බැවින් එම ප්‍රදේශවලද ගැටළු සඳහා මැදිහත් විමට සිදුවන බවද පෙන්වා දෙනලදි. උඩහේනේගම ප්‍රදේශයෙන් පාරහරහා අලි මාරුවීමට නොදී රැකගැනිම අසාර්ථක බවත් දකුණු මහ ඇලෙන් වතුර බී අවසන් වු පසු ආපසු එලවා දැමීම සුදුසු බවත් පෙන්වා දෙනලදී.

**ගරු ලේකම් - හිලෝගම ගොවි සංවිධානය**

වනඅලි සිටින කැලෑ ප්‍රදේශයට ඔවුන්ට බීම සඳහා ජලය ගෙනගොස් දැම්ම සුදුසු බවත් කුඹුරුවල අස්වනු නෙලා අවසන් වු පසු වි සුවඳට ගෙවල්වලට ඒමට ඉඩඇති බවත් පෙන්වා දෙනලදි.

**ස්ථාන භාර නිලධාරි අඩවි වනජිවි කාර්යාලය - නිකවැරටිය**

කුඩා සතුන්ට ජලය ගෙනගොස් දැමුවද ලොකුසතුන්ට ප්‍රමාණවත් පරිදි ජලය ගෙනගොස් දැමිය නොහැකිබව පෙන්වා දෙනලදි.

එළඹෙන ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටුවේදි නිවාස ව්‍යාපෘතියක් සඳහා එම ඉඩම් ලබාදිම සඳහා යෝජනා කිරිමට බලාපොරොත්තුවන බව දැන්විය.

**නේවාසික ව්‍යාපෘති කළමණාකරු**

වන අලි එලවා හැරීම තනිව කළ නොහැක්කක් බවත් සියළුදෙනා සහයෝගයෙන් කළයුත්තක් බවත් සම්බන්ධිකරණ කමිටුවේදි සභාය සඳහා ග්‍රාමාරක්‍ෂක නිලධාරීන් සම්බන්ධ කරගැනිමට ඉල්ලිමක් කිරිම සුදුසු බව පෙන්වා දෙනලදි.

**ගරු සභාපති - දණ්ඩුවාව ගොවි සංවිධානය**

තෙලහැර ප්‍රදේශයේසිට වනඅලි පස් දෙනෙකු පසුගිය දිනවල කුඹුරුවලට හානි සිදුකිරීමට පැමිණි බවත් ඔවුන් නැවත තෙලහැර ප්‍රදේශයටම එලවා හැරීමට කටයුතු කළබව දැන්විය.

**ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු - නිකවැරටිය**

ජලාශයේ ජල ධාරිතාවය අඩි 13 අගල් 06 ක් බවත් එය අක්කර අඩි 4755 බවත් පෙන්වා දෙනලදි. දැදුරුඔය ජලාශයෙන් ජලය ලැබුණු නිසා රිදිබැඳිඇල ව්‍යාපාරයේ ගොවින්ට ජල හිගයක් නොදැණුන බව පෙන්වා දෙනලදි.

එළඹෙන මාස් කන්නයේ වී වගාව සඳහා ජලය ලබාදියයුතු අතර මෙම කන්නයේදි කුඹුරු සඳහා ජලය ලබාදුන් පසු ජලාශයේ අඩි 13 ක ජල ප්‍රමාණයක් ඉතිරිකර ගැනිමට බලාපොරොත්තු වනබව පෙන්වා දෙනලදි. මාගල්ල ජලාශයෙන් බීමට ජලය ලබාදියයුතු බවත් ජාතික ජල අවශ්‍යතාවයක් පවතින බවත් පෙන්වා දෙනලදි. දැදුරුඔය ජලාශ ව්‍යාපෘතිය යටතේ ඉදිකර ඇති වම්ඇලේ කුඹුරු සඳහාද ජලය අවශ්‍ය වී ඇති අතර ජල මුරයක් ලබාදිමට තීරණය කරඇති බවත් පෙන්වා දෙනලදි.

පිවිසුම් ඇල මාර්ගයේ මාගල්ල ජලාශයට ජලය තත්පරයට ඝන අඩි 100 ලබාගන්නා බවත් මේ දිනවල දැදුරුඔය ජලාශයේ වම්ඇල දිගේ ජලය ලබාදෙන බැවින් තත්පරයට ඝන අඩි 60 ක් ලබාගන්නා බව පෙන්වා දෙනලදි.

**නේවාසික ව්‍යාපෘති කළමණාකරු**

එළඹෙන අගෝස්තු 20 වන දිනෙන් ජලය ලබාදි අවසන් බවත් නියමිත දිනවලින් පසුව සිදුකරන ජල ඉල්ලීම් සඳහා තීන්දු තීරණ ගැනීම සිදුකළ නොහැකි බවත් අදදින ව්‍යාපාර කළමණාකරණ කමිටු රැස්වීමේදි යෝජනා ඉදිරිපත් කළපසු දිස්ත්‍රික් ලේකම් තුමාට ඉදිරිපත් කර තීන්දුතීරණ වලට එළඹෙන බවත් පෙන්වා දෙනලදි.

**ගරු සභාපති - කැබැල්ලෑව ගොවි සංවිධානය**

පවතින නියං සහිත කාලගුණික තත්වය හේතුවෙන් මිනිසුන්ට හා සතුන්ට තමන්ගේ දෛනික ජල අවශ්‍යතා සපුරා ගැනිමට ප්‍රමාණවත් තරම් ජලමූලාශ්‍ර වල ජලය නොමැති නිසා දින 10-15 කට වරක් දකුණු මහඇලේ ජලය ලබාදිම සුදුසු බවට අදහස් දක්වන ලදි.

**ගරු ලේකම් - දිවුල්ලැව ගොවි සංවිධානය**
කඩවලපිටිය වැවෙහි ජලය නොමැති නිසා අවට ජල මූලාශ්‍රවල ජලයද සිඳීගොස් ඇතිඅතර කඩවලපිය වැවට ජලය ලබා දෙනලෙස ඉල්ලා සිටින ලදි.
**ගරු සභාපති - නම්මුවාව ගොවි සංවිධානය**
පසුගිය දිනවල ගොවිජන සේවා ප්‍රාදේශිය නිලධාරි තුමිය,රස්නායකපුර ප්‍රාදේශිය ලේකම්තුමා, මගින් රස්නායකපුර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් කුඩාවැව් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට පවරාදිමට ඉල්ලීම් කළබව ප්‍රකාශ කරනලදි.
නම්මුවාව, කඩිගාව ප්‍රදේශවල ජනතාවට තම සනීපාරක්ෂක කටයුතු සඳහාද මේ දිනවල ජලය නොමැති හෙයින් කඩවලපිටිය, නිරාලියද්ද,සිංගන්දළුව උඩවැව, සිංගන්දළුව පහළවැව, නම්මුවාව මහවැව,න ම්මුවාව තුක්ක නියංදළුව වැව, නෙළුම් වැව, කඩිගාව මහවැව යන වැව් සඳහාද ජලය ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදි.
**ගරු සභාපති - තරණගොල්ල ගොවි සංවිධානය**
පහළ ගලපිටියාගම හා තරණගොල්ල යන වැව් සඳහා ද ජලය ලබාදෙන ලෙසත් එම ප්‍රදේශවල ජනතාවද ජල ගැටළුවෙන් පීඩා විදින බවත් දැන්විය.
**නේවාසික ව්‍යාපෘති කළමණාකරු**
ඉහතින් සඳහන් කළ සියළු වැව් පිරවීම සඳහා ප්‍රමාණවත් ජල ප්‍රමාණයක් මාගල්ල ජලාශයේ නොමැති බවත් භූගත ජලය රදවා ගැනිමට වැව්වල ජලය යම් ප්‍රමාණයක් පමණක් රදවා තබා ගැනීම සුදුසු බවත් පෙන්වා දෙන ලදි.
**ගරු සභාපති - බුදුමුත්තාව ගොවි සංවිධානය**
අනෙක් ප්‍රදේශවල කුඩාවැව් තිබුණද බුදුමුත්තාව ගොවි සංවිධාන බලප්‍රදේශයේ කුඩාවැව් නොමැති හෙයින් නියමිත ජල මුරයෙන් පසු ඇලතුළ ජලය ලබානොදී දින 10 කින් ජලය ලබාදිම සුදුසු බව පැවසිය.
සැප්තැම්බර් 05 දිනට ජලමුරයක් ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදි.
**ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු**
මුර ජලය අවසන් වු පසු නැවත ජලය ලබාදුනහොත් අස්වනු නෙලන කුඹුරු සඳහා වන හානිය වළක්වන්නේ කෙසේද යන්න විමසා සිටින ලදි.
**ආයතන සංවර්ධන නිලධාරි**
කන්න රැස්වීම් තීරනය අනුව සැප්තැම්බර් 10 වන දින අස්වනු නෙලා අවසන් කළයුතු දිනය බැවින් ඊට කලින් ජලය නිකුත් කිරිම නිසා අස්වනු නෙලීමට හානිවන බැවින් 10 න් පසු ජලය නිකුත් කිරිම වඩා සුදුසු බව දන්වා සිටින ලදි.

**ගරු සභාපති - කැබැල්ලැව ගොවි සංවිධානය**
වැව් සඳහා ජලය ගමන්කරන ඇලමාර්ග පමණක් ඉතිරිකර අනෙක් සියළු ගල් කඩුළු වසාදැම්මට යෝජනා කරන ලදි.
**නේවාසික ව්‍යාපෘති කළමණාකරු**
වම්ඇල, මැදඇල ප්‍රදේශවල ජනතාවගේ ජල අවශ්‍යතා විමසන ලදි. එසේම මෙම ජල අවශ්‍යතා ලබාගත්තද දිස්ත්‍රික් ලේකම් තුමාගේ අනුමැතිය ලබාගතයුතු බව පෙන්වා දෙන ලදි.
**ගරු සභාපති - ඉබ්බාවල ගොවි සංවිධානය**
වම්ඇල, මැදඇල ප්‍රදේශවල නළ නවයක් සවිකර ඇතිඅතර එම ප්‍රදේශවල ජනතාවට කිසිදු ජල ගැටළුවක් නොමැති බව දැන්විය. අවශ්‍යනම් එම නල වලින්ද ජලය සැපයිය හැකි බව ප්‍රකාශ කරන ලදි.
**ගරු සභාපති - හීලෝගම ගොවි සංවිධානය**
පානීය ජලව්‍යාපෘතියක් හීලෝගම ගොවිසංවිධාන බලප්‍රදේශයේ මේවනවිට ක්‍රියාත්මක වන බවත් දකුණු මහඇලේ මුර ජලය ලබාදී අවසන් වු පසු එම පානීය ජලව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ළිදෙහි ජලය අඩුවන බැවින් සැප්තැම්බර් 10දින දකුණු මහඇලේ ජලය ලබා දෙන ලෙස ඉල්ලාසිටින ලදි.
**ගරු සභාපති - දිවුල්ලැව ගොවි සංවිධානය**
සැප්තැම්බර් 10 දකුණු මහඇලේ ජලය නිකුත් කරන්නේනම් ජලමූලාශ්‍ර වලට හා මිනිසුන්ට ප්‍රයෝජනයක් වියහැකි බව පෙන්වාදෙන ලදි.
**ගරු සභාපති - කැබැල්ලැව ගොවි සංවිධානය**
මුර ජලය අවසන් වු පසු මිනිසුන්ගේ ජල අවශ්‍යතා සඳහා ජලය ලබාදීමට සැප්තැම්බර් මස 10 දිනට සිදුකළ යෝජනාව ස්ථිර කරනලදි.
**ගරු සභාපති - කිරිදිගල්ල ගොවි සංවිධානය**
පිවිසුම් ඇලේ නොනවත්වා ජලය ගමන්කරන්නේද යන්න විමසා සිටින ලදි.
**ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු- නිකවැරටිය**
ඉදිකිරීම් කිහිපයක් පවතින බවත් එම ඉදකිරීම් සිදුවන්නේ ලබන මස අග භාගයේ බවත් ඉදිකිරීම් සිදුකරන අවස්ථාවේ පමණක් ජලය ගෙන ඒම නතර කරන බවත් පෙන්වාදෙන ලදි.

**ගරු සභාපති - හිලෝගම ගොවිසංවිධානය**

හිලෝගම ගොවිසංවිධාන බලප්‍රදේශයට අයත් කෙත්ඇල අංක 50 ම ජලය හැරවීම අපහසු කාර්යක් බවත් දින 05 ලැලි දමා හරස් කිරීමට සිදුවන බවත් එය සකසා දෙන ලෙසත් ඉල්ලාසිටින ලදි.

**ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු- නිකවැරටිය**

එම අපහසු ස්ථාන හරස් කර ජලය ලබාගන්නා විට වාරිමාර්ග ක්ෂේත්‍ර නිළධාරීන් දැනුවත් කරන ලෙස දන්වා සිටින ලදි.

**නේවාසික ව්‍යාපෘති කළමණාකරු**

දන්වුවාව ප්‍රදේශයට ජලසම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලයෙන් පානීය ජලය ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම සති 02කින් ආරම්භ කරන බවත් කැබැල්ලෑව හිලෝගම ප්‍රදේශ වලට ජලය ලබාදීම සඳහා ප්‍රතිපාදන නොමැති බවත්
ජලසම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලයේ නිළධාරීන් තමාව දැනුවත් කළ බව පැවසීය. තවද ජලසම්පාදන මණ්ඩලයට මාගල්ල ජලාශයේ ජලය ලබාගැනීමට අදාල ගිවිසුමෙහි 20% වැඩිවීමට අදාල යෝජනාව ඉදිරිපත් කර ඇති බවත් එය අනුමැතිය සඳහා ප්‍රධාන කාර්යාලයට යොමුකර ඇති බවත් ජලසම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලයේ නිකවැරටිය ප්‍රාදේශිය කාර්යාලයෙන් දැනුම්දී ඇති බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදි.

**ගරු සභාපති - ඉබ්බාවල ගොවිසංවිධානය**

මැයි මස 18 වන දින පැවති රැස්වීමේදී ජලසම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය මාගල්ල ජලාශයෙන් ජලය ලබාගැනීමට අදාල ගිවිසුම අත්සන් තබන බව පැවසු නමුත් මේවන තෙක් ගිවිසුම් අත්සන් කර නොමැති බවත් 2017 වසරේ මාස 07 ගිවිසුමක් රහිතව ජලය ලබාගෙන ඇති බවත් මීට අදාලව නීතිමය කටයුතු කිරීමට කාලය බව දැන්වීය. පසුගිය වසර වල ලැබියයුතු හිග මුදල් ලැබී ඇත්ද යන්න විමසා සිටින ලදි.

**ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු- නිකවැරටිය**

පසුගිය වසරවලට අදාලව ජලසම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලයෙන් ලැබිය යුතු හිග මුදල් ලැබී ඇති බවත් ගිවිසුම් කාලය අවසන් වී ඇති නමුත් මේ වනතෙක් ගිවිසුමකට එළඹී නොමැති බව පෙන්වාදෙන ලදි.

**ගරු සභාපති- බුදුමුත්තාව ගොවිසංවිධානය**

ගිවිසුම් කඩකළ නිසා එන්තරවාසියක් යැවීමට කටයුතු කිරීම සුදුසු බව ප්‍රකාශ කරනලදි.

**සහකාර ප්‍රාදේශිය කළමණාකරු වී අලෙවි මණ්ඩලය**

මේ වනවිට වී අලෙවි මණ්ඩලය වී මිලදී ගැනීමට සුදානම් බවත් නාඩු වී 1 kg මිල රු.38 බවත් සම්බා සහ කිරිසම්බා 1kg මිල රු.45.00 පෙන්වා දෙනලදි.

**ගරු සභාපති-ඉබ්බාවල ගොවිසංවිධානය**

රක්ෂිත සීමාවල ගස් ඉවත් කිරීම සිදුවිය යුතු බවත් දිගින් දිගටම රක්ෂිත වල ගස් සිටවීම සිදුවන බවද දින්විය.

**නේවාසික ව්‍යාපෘති කළමණාකරු**

රක්ෂිත සීමාවේ ගස් ඉවත් කිරීමට ව්‍යාපාර කළමණාකරණ කමිටුවේදී තීන්දුවක් ගන්නා ලෙස දන්වාසිටින ලදි.

**ගරු සභාපති- කැබැල්ලෑව ගොවිසංවිධානය**

ප්‍රධාන ඇලේ රක්ෂිත සීමාව සඳහා රක්ෂිත කනු දමා වෙන්කර දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

**ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු- නිකවැරටිය**

මේවනවිට ප්‍රධාන ඇලේ යම් ප්‍රමාණයක රක්ෂිත සීමා ලකුණුකර ඇති බවත් මෙම වසර අවසානයේ ප්‍රධාන ඇලේ රක්ෂිත සීමා ලකුණුකර අවසන් කරන බව දන්වාසිටින ලදි.

**ආයතන සංවර්ධන නිළධාරී**

රක්ෂිත සීමාවේ ගස් සිටුවන පුද්ගලයින් ලිඛිතව දැනුවත් කර ගස් ගැලවීම සිදුකරන ලෙසත් අදාල ආයතන සඳහා එම ලිපිවල පිටපත් යොමු කරන ලෙස දන්වාසිටිනලදි.

**ගරු සභාපති- බුදුමුත්තාව ගොවිසංවිධානය**

මාගල්ල වැව් රක්ෂිතය වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ලකුණුකර මායිම් කනු දැමීම ප්‍රමාද වන්නේ ඇයිද යන්න විමසාසිටිනලදී

**ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු**

මේවනවිට මිනින්දෝරු දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇති බවත් මාගල්ල වැව් රක්ෂිතය සති දෙකක් තුළ ලකුණු කිරීම සිදුකරන බවත් පෙන්වාදෙනලදි.

**නේවාසික ව්‍යාපෘති කළමණාකරු**

වැව් රක්ෂිතයේ පදිංචිකරුවන් සඳහා තොරණගොල්ල කැලේ ඉඩම් කට්ටි කර ලබාදුන් බවත් ඊට අදාල විධිවිධාන මේවනවිට සුදානම් වෙමින් පවතින බව පෙන්වා දෙන ලදි.

**ගරු සභාපති- නුස්රත් ගොවිසංවිධානය-නම්මුවාව**

දැදුරුඔය ජලාශ ව්‍යාපෘතිය යටතේ දීර්ඝ කර ඇති දකුණු මහ ඇලෙන් බටදමා ජලය ලබා ගැනීමට අවශ්‍ය විධිවිධාන සලසාදෙන ලෙසත් නම්මුවාව වැව් රක්ෂිතය වගාකරුවන් විසින් අත්පත් කරගෙන ඇතිබවත් ඒවායෙහි ආරක්ෂිත සීමා වෙන්කරදෙන ලෙසත් ඉල්ලා සිටින ලදි.

**නේවාසික ව්‍යාපෘති කළමණාකරු**

දැදුරුඔය ජලාශ ව්‍යාපෘතියත් සමග දීර්ඝකළ දකුණු මහ ඇළේ ගොවිසංවිධාන ලිඛිතව මහාවාරිමාර්ග ලෙස පවරා නොමැති අතර පවරනතෙක් එම ප්‍රදේශවල කටයුතු සිදුකිරීමට හැකියාවක් නොමැති බව පෙන්වා දෙන ලදී. එතෙක් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සමග කටයුතු කරනලෙස දැන්වීය.

2017 යල කන්නයේ වෙනත් බෝග වගාකළ ප්‍රදේශවල වගා කළ ගොවීන්ගේ අස්වැන්න රාජසන්තක කරන බවට කන්න රැස්වීමේ තීන්දුවක් ගත්තද පසුගිය මස 18 දින දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේදී එම යෝජනාව ක්‍රියාත්මක කිරීමට සියලුම ප්‍රාදේශිය ලේකම්තුමන්ලා එකගනොවූ බව පෙන්වාදෙනලදී. එයට හේතුවූයේ 2017 යල කන්නයේ පැවති නියං සහිත කාලගුණික තත්වය නිසා ලංකාවේ සීමිත බිම් ප්‍රමාණයක වී වගාකළ හෙයින් එම යෝජනාව ක්‍රියාත්මක නොකරන බවයි.එම නිසා සාධාරණ දඩ මුදලක් එම ගොවිමහතුන්ගෙන් අයකර ගැනීමට දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව නිර්දේශ කළ බවත් එම දඩමුදල තීරණය කිරීමට ව්‍යාපාරකළමණාකරණ කමිටුවට බලය දුන් බවත් පෙන්වා දෙන ලදී.

**ගරු සභාපති - ඉබ්බාවල ගොවිසංවිධානය**

ක්‍රියාත්මක කිරීම අපහසුනම් මෙවැනි තීන්දුතීරණ නොගතයුතු බවත් එම තීන්දුතීරණ ගන්නා අවස්ථාවේ සියළුම වගකිවයුතු ආයතනවල රාජ්‍ය නිළධාරීන් කන්න රැස්වීමට සහභාගි වු බවද පැහැදිලි කරන ලදී.

**ගරු ලේකම් - බුදුමුත්තාව ගොවිසංවිධානය**

මින් ඉදිරියට වගල් කුඹුරු වගාකරන ගොවිමහතුන්ට එම වගල් කුඹුරු අත් නොහැර යල කන්නයේ වගා කිරීමට ඉඩලබා දෙනලෙස ඉල්ලා සිටිනලදී.

**ගරු සභාපති - බුදුමුත්තාව ගොවිසංවිධානය - දණ්ඩුවාව ගොවිසංවිධානය**

කන්න රැස්වීමේදී ගන්නා ලද තීන්දුතීරණ වෙනස්කර දඩමුදලක් අයකර ගැනිමට ගොවිසංවිධාන නිළධාරීන් ලෙස තමන් අකමැති බවත් මෙලෙස තීන්දුතීරණ වෙනස්වීම තුළ ගොවිසංවිධානය තුළ නිළධාරීන් ලෙස තමන් අපහසුතාවයට පත්වන බවද ප්‍රකාශ කරනලදී.

**ආයතන සංවර්ධන නිළධාරී**

මින් ඉදිරියට එවැනි තීන්දු තීරණ ගන්නාවිට එම තීන්දු තීරණ ක්‍රියාත්මක කළයුතු ක්‍රමවේදය හා ක්‍රියාත්මක කිරීමේ හැකියාව පිළිබඳ අවධානය යොමුකළයුතු බව පැවසිය.

**නේවාසික ව්‍යාපෘති කළමණාකරු**

අක්කර 4000 වී වගාකළද කන්න රැස්වීම පවත්වන අවස්ථාවේ අක්කර 3000 පමණක් ජලය තිබු බවත් සියළුම නිළධාරීන් සමග සාකච්ඡාකර අක්කර 2000 වෙනත් බෝග වගාකිරීමට තීන්දු තීරණ ගත්බවත් පෙන්වාදෙනලදී. මෙසේ තීන්දුතීරණ ගත්තද එම තීන්දු තීරණ ක්‍රියාත්මක කිරීමට තමාට බලයක් නොමැති බවත් අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු පමණක් සිදුකරණ බව පෙන්වා දෙන ලදී.

**කෘෂිකර්ම උපදේශක- නිකවැරටිය**

කැබැල්ල්ලෑව, හීලෝගම, බුදුමුත්තාව, බලගොල්ලාගම, යන ප්‍රදේශවල දුඹුරු පැල කීඩෑවගේ හානිය දැකිය හැකි අතර ජලය වගාවට ප්‍රමාණවත් නම් ජලය කපා හරින ලෙසත් වගාවේ අවසන් අවධිය නිසා කෘෂිරසායනික අවශ්‍ය නොවන බවද අවශ්‍යනම් පමණක් තයෝමෙතෙත්සාං, ඉමිඩාත්ලොපිඩ්, යන කෘෂිරසායනික භාවිතා කළ හැකි බව පෙන්වාදෙනලදී.

වෙනත්බෝග වගාවේ පත්‍ර කනින්නන්ගේ හානි දැකියහැකි අතර දිලිර නාශක යෙදිම ඇතැම් ගොවිමහතුන් විසින් සිදුකරන බවත් දිලිර නාශක යෙදිම අනවශ්‍ය බවත් පෙන්වාදෙන ලදී.

පළාත් නිශ්චිත වැඩසටහන යටතේ බිත්තරවී මිලදිගැනීමට ඉල්ලිම්කර ඇති බවද  පෙන්වාදෙනලදී.

**කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර- නිකවැරටිය**

පොහොර මුදල් ගිණුම්ගත කළ පසු සතියක් ඇතුලත පරීක්ෂා කරන ලෙසත් වැරදි සිදුවි තිබුණහොත් නිවැරදි කරදීම ඉක්මනින් කළයුතු බවත් ගොවිසංවිධාන නිර්දේශය ලබාදෙන විට අක්කර 05 සීමාව සලකා බලන ලෙසත් දන්වා සිටින ලදී.

**ගරු සභාපති- ඒකාබද්ධ ගොවිසංවිධානය**

සහනාධාර පොහොර මුදල් නිර්දේශ කිරීමේදී ගොවිසංවිධානය විසින් එකම ලේඛනයකට අත්සන් තබන නිසා ගොවිසංවිධානයේ සාමාජික නොවන අයටද නඩත්තු අරමුදල් නොගෙවන අයටද අත්සන් තැබීමට සිදුවන බව පෙන්වාදෙන ලදී.

**කෘෂිකර්ම පර්යේෂණ හා නිශ්පාදන සහකාර- නිකවැරටිය**

පොහොර අයදුම්පත්‍රය මත ගොවිසංවිධානයේ රදාපැවැත්ම තිරණය වියයුතු නැති අතරම නවක සාමාජිකයින් සඳහා ඉල්ලුම්පත්‍ර සකස්කර ඡායාරූප ලබාගෙන අළුතින් අයදුම්පත්‍ර ලබාගන්නා බවද පෙන්වාදෙනලදී.

**ගරුසභාපති- ඉබ්බාවල ගොවිසංවිධානය**

වෙනත් බෝග වගාකළ ප්‍රදේශවල එම වගාව අසාර්ථක වූ බවත් එම ගොවීන් සඳහා නියං සහනාධාර ලබාදෙනලෙස ඉල්ලාසිටිනලදී.

**නේවාසික ව්‍යාපෘති කළමණාකරු**

නියං සහනාධාර ලබාදිම පිලිබඳ ප්‍රාදේශියලේකම්තුමා දැණුම්වත් කරන බව දන්වා සිටින ලදී.

**ගරු සභාපති- බුදුමුත්තාව ගොවිසංවිධානය**
ප්‍රාදේශියලේකම්තුමා ව්‍යාපාර කළමණාකරණ කමිටු රැස්වීමට සම්බන්ධ කරදෙනලෙස ඉල්ලා සිටින ලදී.

**නේවාසික ව්‍යාපෘති කළමණාකරු**
ප්‍රාදේශිය ලේකම්තුමා ව්‍යාපාර කළමණාකරණ කමිටුවේ නිත්‍ය සාමාජිකයකු නොවන බවත් ව්‍යාපාර කළමණාකරණ කමිටුවේ සාකච්ජා කිරීමට අදාල ප්‍රාදේශිය ලේකම්තුමාගේ සහභාගිත්වය අවශ්‍ය විශේෂ අවස්ථා වෙතොත් රැස්වීමට සහභාගිවීමට ඉල්ලීම් කළහැකි බව පෙන්වා දෙන ලදී. ව්‍යාපාර කළමණාකරණ කමිටු රැස්වීමෙහි තින්දු තීරණ ගත නොහැකි කරුණු සම්බන්ධයෙන් දිස්ත්‍රික් කාෂිකර්ම කමිටු රැස්වීමට ඉදිරිපත් කරන බවද පෙන්වාදෙනලදී.
වගාහානි ඇත්නම් අදාල නිළධාරින් හමුවී දැනුම්දෙන ලෙසද දන්වාසිටිනලදී.
අනතුරු සියළු රාජ්‍ය නිලධාරින්ට හා ගොවිසංවිධාන නිලධාරින්ට ස්තුති කිරීමෙන් අනතුරුව ප.ව.12.30 පමණ කමිටුව නිමා කරන ලදී.

ආර්.එම්. රාජරත්න
නේවාසික ව්‍යාපාර කළමනාකරු
රිදීබැඳි ඇල ව්‍යාපාරය

R.M. RAJARATHNA
RESIDENT PROJECT MANAGER
RESIDENT PROJECT MANAGER OFFICE
MILLAGODA
NIKAWERATIYA.